# MAHINDA YAPA ABEYWARDANA

Former Speaker

Parliament of Sri Lanka

2025 මාර්තු මස 1 වැනි දින

## <u>මාධ්‍ය නිවේදනය</u>

**2025 පෙබරවාරි මස 27 වන දින පාර්ලිමේන්තුවේ ගරු සභානායක හා අමාත්‍ය බිමල් රත්නායක මහතා විසින් කරන ලද සාවද්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම පිණිසයි.**

මා 1983 මුල්වරට පාර්ලිමේන්තුවට පැමිණි දින සිට 2020 අගෝස්තු මස කථානායකධූරයට පත්ව එම වසරේම සැප්තැම්බර් මාසය වන තෙක්ම, කිසිම දිනක රජයේ නිල නිවසක් ලබාගෙන නොමැති බව ප්‍රථමයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. කථානායක නිල නිවසටද මාහට පැමිණීමට සිදුවූයේ රාජකාරීමය හා ආරක්ෂක හේතූන් මතය. එම නිල නිවසේ ගතකල මුළු කාලය පුරාවටම මාගේ ආහාරපාන සඳහා වියදම් කලේ මාගේ පෞද්ගලික මුදල් බව ඉතා වගකීමෙන් ප්‍රකාශ කරමි. කථානායකවරයකු ගේ ආහාර පාන සඳහා රජයේ මුදල් වැය කිරීමට කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් ද නොමැත. එහෙත් විශේෂ අමුත්තන්, විදේශ තානාපතිවරුන් හෝ විදේශ රාජ්‍යතාන්ත්‍රිකයන් පැමිණෙන අවස්ථාවලදී, ඔවුනට සංග්‍රහ කිරීම රාජකාරිමය කටයුත්තක් වන බැවින්, එවැනි වියදම් කථානායකවරයාගේ වැය බරක් ලෙස සලකා රජයේ වියදමින් සිදුකරනු ලබයි. එවැනි වියදම් සියල්ල එකතුකර එය මාගේ පෞද්ගලික ආහාර වේල් සඳහා දැරීමට සිදුවූ වැය බරක් ලෙස හුවා දැක්වීම ගැන මාගේ කලකිරීම ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

එසේම 1983 සිට 2020 අගෝස්තු මස කථානායකධූරයට පත්වන තෙක්ම, විවිධ අමාත්‍යධූර දැරූ සමයන් වල පවා තනි වාහනයකින් ගමන් කල මා හට කථානායකධූරයට පත්වීමෙන් පසු ගරු අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මැතිණියට සිදුවූවක් මෙන් ආරක්ෂක රථ පිරිවරාගෙන ගමන් කිරීමට සිදු විය.

සෑම කථානායකවරයෙකු වෙනුවෙන්ම වාහන 3 ක් වෙන් කරන අතර (නිල වාහනය හා පරිවාර රථ දෙකක්) ඊට අමතරව පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් ජීප් රථයක් ද වෙන් කර තිබුණි. මාගේ හා ආරක්ෂක නිළධාරීන්ගේ අවශ්‍යතා සඳහා වෙන්කර තිබුණේ මෙම වාහන පමණක් බව දන්වනු කැමැත්තෙමි.

මීට අමතරව මාගේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරීන් පස්දෙනෙකු සඳහා වාහන 5ක් ද ඒ සඳහා ඉන්ධන ද වෙන්කර තිබුණි. එම නිලධාරීන් සඳහා ලබාදුන් වාහන හා ඉන්ධන වර්ථමාන රජයේ ජනාධිපති ලේකම්වරයා විසින් 2025 ජනවාරි මස 21 වන දින නිකුත් කල, මැති ඇමතිවරුන්ගේ කාර්යමණ්ඩල දීමනා පිලිබඳ උපදෙස් පත්‍රිකාවේ සඳහන් චක්‍රලේක වලට අනුකූලව ලබා දී ඇත.

එබැවින් මා වෙත ලබා දී තිබූ වාහන තුනට මාස නවයකට ලක්ෂ 334 ඉන්ධන ලබාදීම සංඛ්‍යාත්මක වුවද විය නොහැකි බැවින් හා වාහන සම්බන්ධ ධාවන කාල සටහන් පාර්ලිමේන්තුව සතුව ඇති බැවින්, මේ සම්බන්ධයෙන් විශේෂ විගණනයක් කරන ලෙස ඉල්ලා සිටිමි.

කෙටි පිළිතුරු අපේක්ෂා කරන සමාජ පසුබිමක මීට වඩා සවිස්තර දත්ත ම විසින් ඉදිරිපත් කිරීම නිෂ්ඵල උවද, සත්‍ය ගවේෂණයට කැමති මාධ්‍යවේදීන් හට තොරතුරු දැනගැනීමේ පනත යටතේ පාර්ලිමේන්තුවෙන් ඉහත සඳහන් විස්තර හා ඉදිරිපත් කල අනෙකුත් චෝදනාසම්බන්ධයෙන් 2023/2024 වර්ෂ වල පමණක් නොව මා පත්වූ 2020 වර්ෂයේ සිට හා ඊට පෙර කාල වල විස්තර උවද ලබාගෙන, සම්පූර්ණ විශ්ලේෂණයක් කර, පලකරන ලෙස ඉල්ලා සිටිනු කැමැත්තෙමි. එසේම මේ සම්බන්ධයෙන් යම්කිසි අක්‍රමිකතාවක් සිදුව ඇත්නම් වහාම ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා ලෙසද ඉල්ලා සිටිමි.

බලය ලබා ගැනීම සඳහා මුසාව සාර්ථක උපක්‍රමයක් උවද, චන්දය දුන් ජනතාවට තමන් එදා ගත් එම තීරණය නිවැරදියයි දිනපතා ඒත්තු ගැන්වීමට මුසාව භාවිතා කිරීම කෙටි කාලීනව උවද සාර්ථක නොවන බව මාගේ විශ්වාසයයි.

රාජ්‍ය දේපළ ප්‍රකෝටි ගණනින් විනාශ කරමින් හා රාජ්‍ය සේවය අකර්මණ්‍ය කිරීමට කටයුතු කල අයටම රාජ්‍ය දේපළ ආරක්ෂා කරමින් රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට සිදුවීම දෛවයේ සරදමක් ලෙස සමහරුන් විග්‍රහ කලද, මා එය දකින්නේ කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව අප රටේ අනාගත යහපත වෙනුවෙන් සිදුවූ ආශීර්වාදයක් ලෙසයි.

අමාත්‍ය බිමල් රත්නායක මහතා විසින් කරන ලද, ටයි කෝට් හැඳගත් පමණින් කෙනෙකු මහත්මයෙකු නොවන බවත්, මහත්මයෙකු වන්නේ හැදියාවෙන් හා ක්‍රියාවෙන් වන බවටත් කල ප්‍රකාශය සමග මා සම්පූර්ණයෙන් එකඟ වන අතර, එයට ඌනපූරණයක් ලෙස දරන තනතුර කවර තරාතිරමක උවද පුද්ගලයෙක් මහත්මයෙක් නොවන බවට ද එක්කරනු කැමැත්තෙමි.

ධම්ම පදයේ සඳහන් පහත ගාථා පාඨ මතක් කරමින් මාගේ කරුණු පැහැදිලි කිරීම අවසන් කරමි.

"එකං ධම්මං අතිතස්ස
මුසාවාදිස්ස ජන්තුනෝ
වීතිණ්ණපරලෝකස්ස
නත්ථි පාපං අකාරියං"
(ධම්මපදය: ලෝක වග්ග 176)

අසත්‍ය කතාකරන, ධර්මය නො සලකා හරින, පරලොව ගැන බලාපොරොත්තු නැති පුද්ගලයන් හට කළ නොහැකි පාපකර්මයක් නැත.

"යෝඅප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුධ්දස්ස පොසස්ස අනංගණස්ස
තමේව බලං පච්චේති පාපං
සුඛුමොරජො පටිවාතංව ඛිතෙතා"
(ධම්මපදය: පාප වග්ග 125)

යමෙක් අනුන්ට විපතක් නොකල පිරිසිදු සිතැති නිර්දෝෂී තැනැත්තෙකුට විපතක් කරයිද, එම විපත උඩු සුළඟට දැමූ දූවිලි රැසක් මෙන් එම අඥාණයා කරාම හැරී එයි.

ජනතාවට දැනෙන යථාර්තයන් මානසික සන්තර්පණයන් අතික්‍රමණය කිරීමට වැඩි කාලයක් ගත නොවන බැවින් රාජ්‍ය යාන්ත්‍රණය යහපත් ලෙස කළමනාකරණය කරගනිමින් රට සංවර්ධනය කරා ගෙනයාමටත්, ජනතාවට ලබාදුන් යහපත් පොරොන්දු ඉෂ්ට කිරීමටත් අමාත්‍ය බිමල් රත්නායක මහතා ප්‍රමුඛ රජයට උනන්දුව හා බුද්ධිය ඉක්මනින් පහළ වේවායි ප්‍රර්ථනා කරමි.

## මහින්ද යාපා අබේවර්ධන

## හිටපු කථානායක

ප. ලි : අමාත්‍ය බිමල් රත්නායක මහතාගේ ප්‍රකාශයට ලබාදුන් ප්‍රචාරයට සමාන ප්‍රචාරයක් මෙම පැහැදිලි කිරීමටත් ලබාදෙන ලෙස සියලු අපක්ෂපාතී හා සාධාරණ මාධ්‍ය ආයතන වලින් ඉල්ලා සිටිමි.